පනත් කෙටුම්පතට එරෙහිව තවත් පෙත්සම් පහක්

ලංකාදීප

(පිලිනි ද සිල්වා සහ රංජන් කටුගම්පොළ)

සියලුම පළාත් සභාවලට මන්ත්‍රීවරුන් තෝරාපත් කර ගැනීමේ ඡන්ද විමසීම එකම දිනයක පැවැත්වීම වෙනුවෙන් සිදු කරන පළාත් සභා ඡන්ද විමසීම (සංශෝධන) පනත් කෙටුම්පත හෙවත් 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පටහැනි බැවින් විශේෂ අර්ථ නිරූපණයක් ප්‍රකාශ කරන්නැයි ඉල්ලා තවත් පෙත්සම් පහක් ඊයේ (28) ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ගොනු කෙරිණි.

මෙම පෙත්සම් ගොනුකර ඇත්තේ නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වන ජනතා ක්‍රියාකාරිත්වය හෙවත් පැෆරල් සංවිධානය, එහි විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි, මහජන එක්සත් පෙරමුණේ මහලේකම් තිස්ස ගාමිණී අමෙසිංහ, ජයවර්ධන යාපා සහ මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ඩලස් අලහප්පෙරුම යන මහත්වරුන් හා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යන අය විසිනි.

නීතිපතිවරයා මෙහි වගඋත්තරකරු වශයෙන් නම් කරනු ලැබ සිටී.

එම පෙත්සම් මගින් පෙත්සම්කරුවන් එම පනත් කෙටුම්පතෙහි ඇතැම් වගන්තීන් ව්‍යවස්ථාවට පටහැනි බැවින් එය ජනමත විචාරණයකට සහ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතර මන්ත්‍රී සංඛ්‍යාවකගේ අනුමැතියට යොමු කරන නියෝගයක් නිකුත් කරන්නැයි ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා ඇත.

ගොනු කළ පෙත්සම්වල මෙසේද සඳහන් වේ.

ඉකුත් ජූලි 28 වැනිදා රජයේ ගැසට් නිවේදනයකින් සියලුම පළාත් සභාවලට මන්ත්‍රීවරුන් තෝරාපත් කර ගැනීමේ ඡන්ද විමසීම එකම දිනයක පැවැත්වීම වෙනුවෙන් සිදු කරන 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන නව පනත් කෙටුම්පතක් නිකුත් කර ඇත. එසේම එම පනත් කෙටුම්පත පසුගිය අගෝස්තු 22 වැනිදා පාර්ලිමේන්තුවේ සභාගත කර තිබේ.

මෙමගින් උතුරුමැද පළාත් සභාව, නැගෙනහිර පළාත් සභාව, සබරගමුව පළාත් සභාව, බස්නාහිර පළාත් සභාව, දකුණු පළාත් සභාව, මධ්‍යම පළාත් සභාව, වයඹ පළාත් සභාව, උතුරු පළාත් සභාව හා ඌව පළාත් සභාව ආදී දිවයිනේ සියලුම පළාත් සභාවන්හි ඡන්දය එකවර පැවැත්වීම හෝ කල්දැමීම පිළිබඳ බලය පාර්ලිමේන්තුවට පැවරෙන ව්‍යවස්ථා සංශෝධනයක් සිදු කිරීමට අපේක්ෂිතය.

එම පනත් කෙටුම්පතෙහි 2, 3, 4, 5 යන වගන්තීන් මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3, 4, 83 යන වගන්තීන් හා 17 වැනි ඡේදය සහ ඊට සවිස්තරාත්මක 154 ඊ, 154 සී, 154 ඒ යන වගන්තීන් උල්ලංඝනය වේ.

මෙම කෙටුම්පතෙහි සඳහන් ඉහත කී වගන්තීන් මගින් පළාත් සභා මැතිවරණය කල් දැමීමට සෘජුවම බලපෑම් එල්ල කරන බවද පෙත්සම්කරුවෝ සිය පෙත්සම් මගින් පෙන්වා දෙති. ඒ හේතුවෙන් ජනතාවගේ සර්වජන ඡන්ද බලයට බලපෑම් එල්ල කිරීමක්ද සිදුවන බව පෙත්සමේ සඳහන් වේ. එසේම ඉදිරිපත් කර ඇති එම සංශෝධන පනත් කෙටුම්පත අනුව වසර පහක් ඉක්මවා පළාත් සභාවක බලයේ සිටින දේශපාලන පක්ෂයේ අභ්‍යන්තර අරමුණු සාක්ෂාත් කිරීමට මඟපාදා සැලසීමක් සහ පළාත් සභාවේ පළාත් සභාව තුළ බහුතර බලයක් හිමි පක්ෂයට වසර පහකට වඩා කාලයක් බලයේ සිටීමේ වරප්‍රසාදයක් සහතික කරන බවද එම පෙත්සම්වලින් පෙන්වා දෙයි.

එසේම මෙම පනතින් පළාත් සභාවේ වසර පහක කාල සීමාව දීර්ඝ කිරීමේ යෝජනාවක් පවතින බැවින් ඉන් ජනතා පරමාධිපත්‍යයට හානියක් සිදුවන බවද පෙත්සම්කරුවෝ පෙන්වා දෙති.

තවද මෙම සංශෝධන මගින් පළාත් සභාවල බලය1 පාර්ලිමේන්තුවට පැවරෙන වගන්තීන්ද ඇතුළත් වන බැවින් එය පළාත් සභා බලතලවලට බලපෑමක් එල්ල කරන බවද පෙත්සමින් පෙන්වා දේ.

එබැවින් මෙම පනත් කෙටුම්පත තුළින් ව්‍යවස්ථාවේ 3, 4, 10, 12, 14 (1) යන වගන්තීන් උල්ලංඝනය වන බවත්, ඉන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බව ප්‍රකාශ කරන්නැයි ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා සිටී.

මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේදී තුනෙන් දෙකක බහුතර මන්ත්‍රී සංඛ්‍යාවකින් සහ ජනමත විචාරණයකින් සම්මත කර ගැනීම සඳහා යොමු කරන ලෙසද පෙත්සම්කරුවෝ සිය පෙත්සම්වලින් ඉල්ලා සිටිති.

නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වන ජනතා ක්‍රියාකාරිත්වය හෙවත් පැෆරල් සංවිධානය වෙනුවෙන් නීතිඥ ශාන්ත ජයවර්ධන සහ නීතිඥ දිනේෂ් ද සිල්වා, පාර්ලිමේන්තු මන්ත්‍රී ඩලස් අලහප්පෙරුම මහතා වෙනුවෙන් නීතිඥ සනත් විජේවර්ධන යන මහත්වරුන් මාර්ගයෙන් මෙම පෙත්සම් ගොනු කර ඇත.